අභ්‍යන්තර විභාග නිවේදනය

මගේ අංකය:- PPSC/EX/1/1/2023
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
පළාත් සභා කාර්යාල සංකීර්ණය
කුරුණෑගල
2023.03.23

ප්‍රධාන ලේකම් (වයඹ)
නාගරික කොමසාරිස්, කුරුණෑගල මහ නගර සභාව

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයෙහි නීති නිලධාරී III වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023 (II)**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ විධායක නිලධාරී III වන ශ්‍රේණියේ නීති නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023 මැයි මස කුරුණෑගල නගරයේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ විධායක නිලධාරී III වන ශ්‍රේණියේ නීති නිලධාරීන්ට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම් කළ හැක.

02. මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේදී පළ කර ඇති අතර මෙහි 04 වන ඡේදයේ උපදෙස් පරිදි සකසා සම්පූර්ණ කල ස්වකීය අයදුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2023.04.21** දින හෝ එදිනට පෙර **ලේකම් , වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය , කුරුණෑගල** යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ විභාගයේ නම සඳහන් කල යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

03. අයදුම්පත්‍ර :- ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය තමා විසින් පිළියෙල කර ගත යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරෙන්ම පිරවිය යුතුය.

04. **විභාග ගාස්තු:-** පළමුවරට මෙම විභාගයට පෙනී සිටිමට කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාර වලදී, විභාගයට පෙනී සිටින්නේ නම් රු. 1200/- ක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරණ ආදායම් ශීර්ෂයට බැර වන පරිදි කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ව.ප.ස.මු. 02 අකෘතියෙන් ලබාගත් රිසිට්පත තම අයදුම්පතෙහි නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කල යුතුය. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

05. අනන්‍යතාවය :- අපේක්ෂකයින් විභාග ශාලාව තුලදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රයක් )

06. **විභාග ප්‍රවේශපත්‍රය :-** විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාල ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සඳහා, **ඔවුන් තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට (E-mail address) විභාග ප්‍රවේශ පත්‍රය යොමු කරනු ලැබේ. අයදුම්කරුවන් විසින් තම විභාග ප්‍රවේශ පත්‍රය භාගත කර ගත යුතු අතර , එලෙස විභාග ප්‍රවේශ පත්‍රය භාගත කර ගත නොහැකි අයදුම්කරුවන් වෙතොත් විභාගය පැවැත්වෙන දිනට දින 03කට පෙර ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයෙන් විමසිය යුතුය.**

එලෙස අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර යොමු කල වහාම ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ ( www.psc.nw.gov.lk ) පළකරන අතර ,ඒ බව අදාල දෙපාර්තමේන්තු වෙත ද ලිඛිතව දැනුම් දෙනු ලැබේ.දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අදාල අයදුම්කරුවන්ව ඒ පිළිබඳව දැනුවත් කළ යුතුය.

**සැළකිය යුතුයි :-**

**අයදුම්කරු විසින් තම අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන විද්‍යුත් තැපැල් ලිපිනයට ප්‍රවේශ පත්‍රය යොමු කරන බැවින් , එය නිවැරදිව අයදුම්පත්‍රයේ සඳහන් කිරීම අනිවාර්යය වේ.**

**07.** විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර ලැබූ, පළමුවතාවට විභාගයට පෙනී සිටින නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතු අතර ගමන් ගාස්තු නොගෙවිය යුතුය.

08. අපේක්ෂකයින් අදාල සේවයට ඇතුලත්වීම සඳහා වු විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සැපයිය යුතුය. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝරාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.

09. එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාර වලදී පෙනී සිටීමට නිලධාරීනට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂයකට අවම වශයෙන් 40% ක් නිලධාරියා විසින් ලබා ගත යුතුය.

10. විභාග පරිපාටිය :-

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| අනු අංක | විෂයය | කාලය | උපරිම ලකුණු |
|---|---|---|---|
| 1 | ආයතන රෙගුලාසි | පැය 02 | 100 |
| 2 | මුදල් රෙගුලාසි | පැය 02 | 100 |

**විෂය නිර්දේශය :**

1. **ආයතන රෙගුලාසි** (කාලය පැය 02 යි - ලකුණු 100 යි)
   රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා ආයතන සංග්‍රහයේ II, IV, V, VII, VIII, XII, XIII පරිච්ඡේද හා විනය කාර්ය සංග්‍රහය

2. **මුදල් රෙගුලාසි** (කාලය පාය 02 යි - ලකුණු 100 යි)
   මුදල් රෙගුලාසි සංග්‍රහයේ I, II, III, IV, VI, VIII පරිච්ජේද හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය

11. මෙම විභාග නිවේදනයේ විධි විධාන සලසා නොමැති කවර කරුණක් පිළිබද වුවද ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

ඊ.එම්.පී.ඒකනායක,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව